# කීත් නොයාර් පැහැර ගැනීමේ ඇතුළත කතාව

චාමර ලක්ෂාන් කුමාර

මාධ්‍යවේදීන්ගේ හිතවතෙකු ලෙස පෙනී සිටියද මහින්ද රාජපක්ෂ රටේ ජනාධිපති ධුරය හෙබවූ වසර දහය, "සිවුවැනි ආණ්ඩුව" ලෙස සැලකෙන ජනමාධ්‍යවේදයට ඒ හැටි සුවදායි කාල පරාසයක් නොවීය. දුසිම් දෙකකට වඩා වැඩි ගණනක් මාධ්‍යවේදීන් ඝාතනය වූ තවත් එවැනිම වූ ගණනක් පැහැර ගැනීම්, ශාරීරික පීඩාවනට ලක්වූ ඒ සමය, මාධ්‍යවේදීන්ට "හිම" සමයක්ම විය. රාජපක්ෂ පාලනය යටතේ, මාධ්‍යවේදීන් අරභයා දියත් වූ එම මාධ්‍ය මර්දනයට අදාළ සිදුවීම් මාලාව පෙළගැස්වත්දී කීත් නොයාර්ව හා සම්බන්ධ සිදුවීමට හිමි වනුයේ වැදගත් ස්ථානයකි. දෙහිවල වෛද්‍ය පාරෙහි පිහිටි තම නිවෙස ඉදිරිපිට දී 2008 මැයි 22 වැනිදා පැහැර ගැනීමට ලක්වූ මාධ්‍යවේදී කීත් නොයාර්ව ඉන් පැය කිහිපයකට පසු යළි හමුවෙත්දී දරුණු වධ බන්ධන රැසකට ලක්ව තිබිණි. පැහැර ගැනීම සිදුවෙත්දී කීත්, සේවය කළේ "ද නේෂන්" පුවත්පතේ සම කර්තෘවරයා ලෙසිනි. සම කර්තෘවරයා ලෙස පැවරී ඇති පරිපාලන වගකීම් ඉටුකරන අතරතුර කීත් "ද නේෂන්" වෙනුවෙන් "සෙන්පති" යන ආරූඪ නාමය යටතේ "මිලිටරි මැටර්ස්" හිසින් ආරක්ෂක ලිපියක් ද සතිපතා ලිවේය. සමකාලීන ආරක්ෂක ලිපි අතර එය ඉදිරියෙන්ම වූයේ වඩාත් විශ්වසනීය ලෙස කීත් එය අපූරුවට පෙළ ගැස්වූ බැවිනි. යහපත් මාධ්‍යකරණයේ සැම සිද්ධාන්තයක්ම තම ලිපිය සැකසීමේදී අනුගමනය කළ කීත්, දැනුම අතින් ද අතිශය පොහොසත් මාධ්‍යවේදියෙක් විය. ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය ඉදිරියට ඇදෙමින් තිබූ නිසා යුද උන්මාදයෙන් රට වෙළී ගොස් තිබූ මොහොතක වුවද ආරක්ෂක අංශ තුළ සිදු වන දූෂණ හා ඉහළ නිලධාරීන්ගේ අකටයුතුකම් කීත් නිර්භයව විවේචනය කළේය. රණවිරුවන් උත්කර්ෂයට පමණක් නංවමින් සිටි සංස්කෘතියක් තුළ එය උඩුගං බලා පිහිනීමක් විය. පැහැර ගැනීමට දින කිහිපයකට පෙර 2008 මැයි 11 වන දින "ද නේෂන්" පුවත්පතට ලියූ තම ආරක්ෂක කොලම වෙනුවෙන් කීත් භාවිත කර තිබූ ශීර්ෂ පාඨයේ සිංහල තේරුම වූයේ "යුද හමුදාව, එහි ප්‍රධානියාගේ පෞද්ගලික නින්දගමක් නොවේ" යන්නය.

බම්බලපිටිය ශාන්ත පීතර විදුහලේ ආදි සිසුවකු වූ කීත් ලෙරොයි නොයාර් තම වෘත්තීය මාධ්‍ය දිවිය ඇරඹුවේ සන්ඩේ ටයිම්ස් පුවත්පත සමගය. එහි පුස්තකාලාධිපතිවරයා ලෙස වැඩ ඇරඹූ කීත් අනතුරුව එහි වාර්තාකරුවකු බවට පත්ව ක්‍රමයෙන් වෘත්තීයමය වශයෙන් ඉහළට නැංගේය. ද නේෂන් හා එක්වීමට පෙර කීත් ඩේලි මිරර් පුවත්පතේ නියෝජ්‍ය කර්තෘවරයා ලෙස කටයුතු කළේය. ශාරීරිකව ගත් කල කීත් පාංශු දේහධාරියකු නොවීය. අඩි පහකට වඩා මදක් උස්වූ ඔහු වෙතින් පිටතට පෙනුණේ පුජ්‍යවරයකුගේ ස්වභාවයකි. මෘදු වචන කථා කළ හෙතෙම සන්සුන් මනසක් ඇත්තෙක් විය. ඒ නිසාම සහෝදර මාධ්‍යවේදීන් අතර ඔහුට තිබුණේ ඉහළ පිළිගැනීමකි. නමුත් ඔහුගේ භාෂා හැසිරවීම අතිශය ප්‍රවේගකාරී එකක්ම විය. සතිපතා ආරක්ෂක ලිපිය රචනා කිරීම ඇරැඹීමෙන් පසු සහෝදර මාධ්‍යවේදීන් අතර "කර්නල්" නමින් කීත් ප්‍රචලිත වන්නට විය. "කර්නල්" ගේ මාධ්‍ය භාවිතාව "ද නේෂන්" හි පාඨකයන් ඉහළින් වැළඳ ගත්ත ද එය වහකඳුරු වූ මෙන් පිරිසක් ද සිටි බව 2008 මැයි 22 වැනිදා රාත්‍රියේ සිදු වූ පැහැර ගැනීමෙන් පෙනී ගියේය. රටේ ප්‍රධාන සතිඅන්ත ඉංග්‍රීසි පුවත්පතක "දෙවැන්නා" පැහැර ගැනීම හා ඔහුව දරුණු වද බන්ධනයනට ලක් කිරීම සම්බන්ධයෙන් සාධාරණ පරීක්ෂණයක් අනිවාර්යයෙන්ම සිදුවිය යුතු මුත් රාජපක්ෂ සමයේ දී එය "වචනයක"ට පමණක් සීමා විනි. "කීත් ව හම්බ වුණානේ" කියමින් ආරක්ෂක අංශ ද ඒ ගැන සෙවීමට වැඩි උනන්දුවක් නොදැක්වූහ. ඒ ආකාරයට 2015 ජනවාරි 08 වැනි දින "යහපාලන" වෙනස සිදු වන තෙක්ම කාලයේ වැලිතලා මතින් මේ සිදුවීමේ සුලමුල වැසී තිබිණි. සැබැවින්ම කීත් නොයාර්ව පැහැර ගැනීම හා ඔහුව ශාරීරික පීඩාවනට ලක්කිරීම සම්බන්ධව සැබෑ පරීක්ෂණය ඇරැඹුණේ මේ අපකීර්තිමත් සිදුවීම වී වසර 07කට පමණ පසුවය. සිදුකරන ලද ඒ පරීක්ෂණයේ ප්‍රතිඵල ලෙස මේ සිදුවීමට අදාළව ලොමු ඩැහැගන්වනසුලු තොරතුරු රැසක් අනාවරණය කරගැනීමට පරීක්ෂකයන් මේ වන විට සමත්ව ඇත. ඒ අනුව කීත් පැහැරගත් බව කියමින් යුද හමුදා බුද්ධි අංශයට සම්බන්ධ නිලධාරීන් කිහිපදෙනකු මේ වන විටත් අත්අඩංගුවට ගෙන ඇති අතර මේ සිදුවීම වූ සමයේ බුද්ධි අංශ භාරව කටයුතු කළ ඉහළ නිලධාරීන් කිහිපදෙනකුවද වැඩිදුර ප්‍රශ්න කිරීම සඳහා රහස් පොලිසිය කැඳවා ඇති බව දැනගන්නට ඇත. අතිශය සියුම් ආකාරයට දුරකථන දත්ත විශ්ලේෂණය කරමින් මේ මහා "අපරාධය" පිළිබඳ තොරතුරු අනාවරණය කරගැනීමට පරීක්ෂකයන් සමත්ව ඇති අතර මේ සිද්ධියට අදාළ සමස්ත සිදුවීම් ජාලය අපට ත්‍රාසජනක බටහිර චිත්‍රපටයක් සිහිගන්වයි. කීත් නොයාර්ව පැහැර ගැනීම හා සම්බන්ධ වගකිවයුත්තන් කොටු කරගත් ආකාරය පිළිබඳ විස්තර කිරීමට මත්තෙන් එම අවාසනාවන්ත සිදුවීම වූ දිනය වෙත පාඨක ඔබව රැගෙන යෑමට කැමැත්තෙමු.

පැහැර ගැනීමට ලක්වීමට පැය කිහිපයකට පෙර කීත්, "රිවිර මීඩියා කෝපරේෂන්" හි ප්‍රධාන විධායක නිලධාරී ක්‍රිෂාන්ත ප්‍රසාද් කුරේ හා "ද නේෂන්" හි ප්‍රධාන කර්තෘ ලලිත් අලහකෝන් සමග තම රාත්‍රී භෝජනය ගෙන තිබේ. ඩුප්ලිකේෂන් පාරෙහි පිහිටි ක්වීන්ස් කැෆෙහිදී එදින රාත්‍රී ආහාරය ගනිත්දී කථා කිරීමට බොහෝ දෑ තිදෙනාට විය. පෙර දිනයේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට තෝරා ගැන්ම වෙනුවෙන් වූ ඡන්ද විමසීමේදී ශ්‍රී ලංකාව, පාකිස්තානය හමුවේ පරාජයට පත්වීම ඇතුළු යුද්ධය, දේශපාලනය හා තම ආයතනය සම්බන්ධ කාරණා යනාදී ලෙස කථා කිරීමට බොහෝ මාතෘකා තිබුණ ද ඒ අතරින් ඔවුන් වැඩි අවධානයක් දැක්වූයේ තම ආයතනය සම්බන්ධව මතුව ඇති නවතම තත්ත්වය පිළිබඳ සාකච්ඡා කෙරුමටය.

"රිවිර මීඩියා කෝපරේෂන්" මගින් ප්‍රකාශයට පත් කරන "රිවිර" හා " ද නේෂන්" පුවත්පත් එම සති අන්තයේදී තම දෙවැනි සංවත්සරය සැමරීමට සූදානමින් සිටි මුත්, ආයතනික "වෙනස්වීම්" සිදුවීම ඒ වන විට ඇරැඹී තිබිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍ය කර්මාන්තය තුළ විප්ලවීය වෙනසක් සිදුකරමින් අතිවිශාල මූල්‍ය ආයෝජනයක් සහිතව "දැඩි ස්වාධීන" පුවත්පත් ආයතනයක් ලෙස ආරම්භ කළ "රිවිර මීඩියා කෝපරේෂන්" හි අයිතිය හිමිව තිබුණේ ආචාර්ය සේන යද්දෙහිගේ මහතාගේ සභාපතිත්වයෙන් යුතු ව්‍යාපාරික පිරිස් සමාගමටය. දීර්ඝ කාලීන ආයෝජන ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කළ නමුත් හේතුන් ගණනාවක් මත "රිවිර මීඩියා කෝපරේෂන්" හි අයිතිය විකි"මට යද්දෙහිගේ මහතා තීරණය කර තිබිණි. නව ආයෝජකයා ලෙස සමාගම භාරගැනීමට කැමැත්ත පළ කර තිබුණේ ලන්ඩනයේ සිටි දේපොළ වෙළෙඳාම් තැරැව්කරුවකු වූ නිලංක රාජපක්ෂය. රාජපක්ෂ කෙනෙකු වීම තුළ ඔහු මහින්ද රාජපක්ෂගේ ඥාතියකු නොවුවද නිලංක හිටපු ජනාධිපතිවරයාගේ සමීපතම හිතවතෙකු විය. මේ සිදුවීම සිදුවන විට ඒ ගනුදෙනුව සිදුව තිබුණුත් ඒ පිළිබඳ වැඩි විස්තර පිටතට පැමිණියේ නැත. කෙසේ වෙතත් 2008 වසරේ මාර්තු මාසයේ තුන්වැනි සතියේ පැවැති පාර්ලිමේන්තු විවාදයක් අතරතුර ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීවරයා "රිවිර විකි"මේ ගනුදෙනුවේ" තෝම්බුව දිගහැර තිබුණේ ගණන් හිලවු ද සමගිනි. "ස්වාධීන මාධ්‍ය අත්පත් කරගැනීමේ අලුත්ම රාජපක්ෂ ක්‍රමය" ලෙස එය ඔහු විස්තර කර තිබිණි. සෙලාන් බැංකුවේ මිලේනියම් ශාඛාව නිකුත් කළ, සුජිත් රාජපක්ෂ නම් පුද්ගලයකු අත්සන් කළ 574484 අංක දරන චෙක්පත මගින් රුපියල් මිලියන 100ක මුදලක් ජාතික සංවර්ධන බැංකුවෙහි "රිවිර මීඩියා කෝපරේෂන්" සතු ගිණුමට බැර කර ඇති බව කිරිඇල්ල මන්ත්‍රීවරයා හෙළි කළේය.

ලන්ඩනයේ සෑහෙන කලක් ජීවත් වූවකු ලෙස නිලංක රාජපක්ෂව, ක්‍රිෂාන්ත හොඳින් දැන සිටියේය. නිලංක ද තමා සමග වැඩ කරන ලෙස ක්‍රිෂාන්තගෙන් ඉල්ලා සිටිමුත්, නව පාලනය සමග කටයුතු කිරීමේ අදහසක් ඔහුට නොවීය. පෞද්ගලික ප්‍රශ්නයකට වඩා එය ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රශ්නයක් විය. දැඩි රාජපක්ෂ හිතවාදියකු වන නිලංකගේ කළමනාකාරිත්වය යටතේ පෙර මෙන් නිදහසක්, නොලැබෙන බව ක්‍රිෂාන්ත හොඳාකාරවම දැන සිටියේය. ඔහු සිටියේ තීන්දුවක් ගැනීමට සැරසෙමිනි. "රිවිර" හා ද නේෂන් හි අනාගතය පිළිබඳ ලලිත්, කීත් හා ක්‍රිෂාන්ත රෑ කෑම ගනිමින් බොහෝ දෑ කථා කළෝය. පිරිස පිටව යෑමට සැරසෙත්දී හෝරා යන්ත්‍රයේ වේලාව රාත්‍රී දහයට ආසන්න වී තිබිණි.

තිදෙනා වෙන වෙනම පිටත් වූ අතර කීත් තමන් පරිහරණය කළ මෝටර් රථයෙන් දෙහිවල වෛද්‍ය පාරෙහි පිහිටි නිවෙස බලා පිටත්ව යන ලදී. ගමන අතරතුරදී ඔහු තම බිරිය වූ රෝෂි"ට ඇමතුමක් ගත්තේය. තමා නිවෙස බලා පැමිණෙමින් සිටින බවත්, ඉදිරි දොර අඩවල් කර තබන ලෙසත් කීත් දැනුම් දුන්නේය. ඒ අනුව දොර අඩවල් කර තැබූ රෝෂි" නිවෙස තුළට පිවිසියාය. එසේ කර සෑහෙන වේලාවක් ගත වූ මුත් කීත් නිවසට පැමිණියේ නැත. මේ අතරවාරයේ නිවස ඉදිරිපිට මෝටර් රථයක එන්ජිම නොනවත්වා ධාවනය වන හඬ රෝෂිණිට ඇසිණි. ඒ පිළිබඳ සොයා බැලීමට පිටතට පැමිණෙත්දී තම සැමියාගේ මෝටර් රථය ගේට්ටුව ඉදිරිපස නතර කර ඇති ආකාරය ඇය දුටුවාය. මෝටර් රථයේ එන්ජිම නිවා දමා නොතිබූ අතර විදුලි බුබුළු ද දැල්වෙමින් පැවැතිණි. රියැදුරු අසුන පැත්තෙහි ඇති දොර ද විවෘත කර තිබිණි. එහෙත් කීත් එහි සිටින බවට කිසිදු ලකුණක් නොවීය. එම දර්ශනයෙන් බෙහෙවින් තැතිගැනීමට පත් රෝෂිණි වහා නිවෙස තුළට පැමිණ තමන් දුටු දේ "ද නේෂන්" හි නියෝජ්‍ය කර්තෘ ගාමිණී අබේවර්ධන හට දැනුම් දුන්නාය. ගාමිණී, ඒ බව ලලිත්ට දැනුම් දුන් අතර ඔහු එය ක්‍රිෂාන්තට දැනුම් දුන්නේය. සුළු මොහොතක් ඇතුළත සියලු දෙනා කීත්ගේ නිවෙසට එකතු විය. වැඩි වේලාවක් ගතවන්නට පෙර පවුලේ ඥාතිහු, රිවිරේ හිතවතුන්ගෙන් වෛද්‍ය පාරේ නිවෙස පිරී යන්නට විය.

කීත් ව පැහැරගෙන ගොස් ඇති බව සැකයකින් තොරව තහවුරු කරගැනීමට ක්‍රිෂාන්ත ලලිත් ඇතුළු පිරිසට වැඩි වේලාවක් අවශ්‍ය නොවීය. ඒ මොහොතේ කීත්ගේ නිවෙස මළගෙදරක සිරි ගත්තේය. රෝෂිණි නෝයර් පමණක් නොව කුඩා දියණිය හා පුත්‍රයා ද පියා නැති ශෝකයෙන් ගෙය දෙවනත් කරන්නට වූහ. "තාත්තා කොහේද? එයාව ගෙදර එක්කන් එන්න අන්කල්" කියමින් කීත්ගේ කුඩා දියණිය ක්‍රිෂාන්ත කුරේගේ දෑතේ එල්ලී හඬන ආකාරය රැස්ව සිටියවුන්ගේ දෙනෙතට කඳුළු ගෙන ආවේ නිරායාසයෙනි.

මේ අතරවාරයේ සිදුව ඇති දේ පිළිබඳ

43 වන පිටට



අනුනවයෙන් ජීවිකය බේරාගත් මාධ්‍යවේදී කීත් නොයාර් මහතා රෝහලේ දී.. ඔහු පසුව ජීවිතාරක්ෂාව පතා ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය විය